සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

# නර්තනය

**6 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 - 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 පා සරඹවල තුන්වන පා සරඹ පදය වන්නේ,
(1) තෙයිකිට තෙයි තාම් (2) තෙයි තෙයි
(3) තෙයිකිට තෙයිකිට තෙයිකිට තෙයි තාම් (4) තේයි තිතා තෙයි

02 පළමුවෙනි ගොඩ සරඹයේ කස්තිරම වන්නේ,
(1) තත් ජිත් තොං නං තා ය.
(2) තත් ජිත් තක ජිත් තත් ජිත් තොං නම් තා ය.
(3) ගත්තකු ජිත්තම් ගජිතකු පිත්තම් තරිකිට ජිත් තරිකිට දොම්කිට තා ය.
(4) රුංතක ජිංතක තරිකිට කුංදත් තා ය.


03 දකුණුපස රූපයෙන් නිරූපණය වන්නේ කුමන අවස්ථාවක් ද?
(1) දුක
(2) සතුට
(3) ශෝකය
(4) ක්‍රෝධය



04 විකල්ප වාද්‍ය උපකරණයක් නොවන්නේ,
(1) දඬුබෙරය (2) ටින් බෙරය (3) සිලි සිලිය (4) ගැටබෙරය

05 කළගෙඩි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුමකි
(1) කෝලාට්ටම් (2) සුලකු (3) සෙම්බු (4) අරියවෙට්ටු

- අංක 06 - 10 දක්වා ප්‍රශ්නවලට පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.




06 උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ඇතුළත් අංකය වන්නේ,
(1) 2 (2) 3 (3) 4 (4) 1

07 4 වන රූපයෙන් දක්වෙන්නේ කුමන නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩය ද?
(1) උඩරට (2) සබරගමු (3) පහතරට (4) ද්‍රවිඩ

08 සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩය දක්වෙන අංකය කුමක් ද?
(1) 2 (2) 1 (3) 4 (4) 3

09 කඩිප්පු දෙකක් ආධාරයෙන් වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩයේ අංකය වන්නේ,
(1) 3 (2) 1 (3) 4 (4) 2

10 හේවිසි වාදනයේ දී අතින් සහ කඩිප්පුවෙන් වාදනය කරන වාද්‍ය භාණ්ඩයක් වන්නේ,
(1) 1 (2) 3 (3) 4 (4) 2

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා වගන්ති නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11 ගොඩ සරඹ ගණනින් දොළසකි. ( )

12 උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය දෙවොල් මඩුවයි. ( )

13 වෙසක් උත්සවයේදී භක්ති ගීත ගායනා කරනු ලබයි. ( )

14 කළගෙඩි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුමකි කෝලාට්ටම්. ( )

15 මණ්ඩිය සඳහා විලුම් දෙක අතර පරතරය මිටි රියනකි. ( )

- **A කොටසේ පිළිතුරට නිවැරදි පිළිතුර B කොටසේ පිළිතුර සමග යා කරන්න.**

| | A - කොටස | | B - කොටස |
|---|---|---|---|
| 16 | පාන්දරින් ඉස්කෝලෙට | 1. | තාලම්පට |
| 17 | තිත් තෙයි | 2. | කෝලාට්ටම් |
| 18 | ලී කෙළි නැටුම | 3. | හනුමා වන්නම |
| 19 | සුළු තනි තිත | 4. | දඬුබෙරය |
| 20 | විකල්ප වාද්‍ය භාණ්ඩයකි | 5. | සෝමතිලක දිසානායක |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) ශ්‍රී ලාංකීය ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් තුන නම් කරන්න.

(2) ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් ප්‍රභවය ලැබූ ප්‍රදේශ එක බැගින් ලියන්න.

(3) ප්‍රධාන නර්තන සම්ප්‍රදායන්වලට අයත් ප්‍රධාන වාද්‍යය භාණ්ඩ තුන සම්ප්‍රදායන් අනුව නම් කරන්න.

(4) උඩරට නර්තන සම්ප්‍රදායට අදාළ රංග වස්ත්‍රාභරණ කට්ටලය නම් කරන්න.

(5) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මය නම් කරන්න. (ලකුණු 10 යි.)

02 (i) හනුමා වන්නමේ බෙර පදය ලියන්න. (ලකුණු 05 යි.)

(ii) හනුමා වන්නමේ ඔබ කැමති කවියක් ලියන්න. (ලකුණු 05 යි.)

03 ගැටබෙරය, දඬුබෙරය, තම්මැට්ටම, පැපොල් බටනළාව, ගොප්කොළ නලාව, දවුල, ටින් බෙරය, දෙවොල් බෙරය, චල් වලල්ල, බංකු රබාන

ඉහත සඳහන් භාණ්ඩ සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය භාණ්ඩ වශයෙන් වගුගත කරන්න. (ලකුණු 10 යි.)

| සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ | විකල්ප වාද්‍ය භාණ්ඩ |
|---|---|
| | |

04 (i) බෞද්ධ ජනතාවට වෙසක් පොහෝ දිනය වැදගත් වන්නේ කුමක් නිසාද? (ලකුණු 05 යි.)

(ii) වෙසක් උත්සවය හා සබැඳි සැරසිලි හා සාරධර්ම 2 ක බැගින් ලියන්න. (ලකුණු 05 යි.)

05 (i) ඔබ පංති කාමරයේ දී ඉගෙන ගත් සිංහල ගැමි නැටුම්වලට සමාන ද්‍රවිඩ ගැමි නැටුම් 2 ක් නම් කරන්න. (ලකුණු 05 යි.)

(ii) කාන්තාවන් සඳහා ම පමණක් විශේෂ වූ සිංහල ගැමි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුම කුමක් ද? (ලකුණු 05 යි.)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 06 | 2 | 11 | ✓ | 16 | 5 |
| 02 | 1 | 07 | 3 | 12 | X | 17 | 1 |
| 03 | 2 | 08 | 2 | 13 | ✓ | 18 | 2 |
| 04 | 4 | 09 | 4 | 14 | X | 19 | 3 |
| 05 | 3 | 10 | 1 | 15 | ✓ | 20 | 4 |

(1 x 20 = 20)

## II කොටස

01 (1) උඩරට නර්තන සම්ප්‍රදාය / පහතරට නර්තන සම්ප්‍රදාය / සබරගමු නර්තන සම්ප්‍රදාය

(2) උඩරට - මහනුවර, කුරුණෑගල, උඩුනුවර, යටිනුවර, දුම්බර, හේවාහැට ආදි වශයෙන්

පහතරට - ගාල්ල, මාතර, අම්බලන්ගොඩ, කොළම ආදී වශයෙන්

සබරගමු - කෑගල්ල, රත්නපුරය, පැල්මඩුල්ල ආදී වශයෙන්

(3) උඩරට - ගැටබෙරය

පහතරට - පහතරට බෙරය, දොවොල් බෙරය, සෝෂක බෙරය, රුහුණු බෙරය ආදී වශයෙන්

සබරගමු - දවුල

(4) උඩරට - වෙස් ඇඳුම් කට්ටලය

(5) උඩරට සම්ප්‍රදාය - කොහොඹා කංකාරි ශාන්තිකර්මය

02 (i) බෙර පදය - කුද ගත ගත දොම්, දොම්කිට කිට දොම් (ලකුණු 05 යි.)

(ii) කවියක් ලියා ඇත්නම් (ලකුණු 05 යි.)

03

| සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ | විකල්ප වාද්‍ය භාණ්ඩ |
|---|---|
| ගැට බෙරය | දඬු බෙරය |
| තම්මැට්ටම | පැපොල් බටනලාව |
| දවුල | ගොක්කොල නලාව |
| දෙවොල් බෙරය | ටින් බෙරය |
| බංකු රබාන | චල් වලල්ල |

(ලකුණු 10 යි.)

04 (i) බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සිහි කිරීමයි. (ලකුණු 05 යි.)

(i) සැරසිලි - වෙසක් කූඩු, තොරන්

සාරධර්ම - සිල් සමාදන් වීම / දන්සල් දීම / ලේ දන්දීම ආදී වශයෙන් (ලකුණු 05 යි.)

05 (i) කළ - සෙම්බු / ලී - කෝලාට්ටම් (ලකුණු 05 යි.)

(ii) කළ - සෙම්බු (ලකුණු 05 යි.)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2019

6 ශ්‍රේණිය

## නර්තනය

### ප්‍රායෝගික පරීක්ෂණය

01 කළගෙඩි, ලී කෙලි, නැලවිලි කවි වලින් නම් කරන ලද ගායනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10 යි.)

02 හනුමා වන්නමේ ඔබ කැමති ගායනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10 යි.)

03 2 වන පා සරඹය හා හමාර පදය නර්තනය කරන්න. (ලකුණු 10 යි.)

04 පළවෙනි ගොඩ සරඹය කස්තිරමත් සමග නර්තනය කරන්න. (ලකුණු 10 යි.)

05 මගෙ පොඩි යාලු හෝ පාන්දරින් ඉස්කෝලෙට යන ගීත දෙකෙන් එකක් ගයමින් නර්තනය කරන්න. (ලකුණු 10 යි.)